සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
# Third Term Test - Grade 6 - 2019

නම/විභාග අංකය :........................................ කතෝලික ධර්මය කාලයඃ පැය 02යි.

## I කොටස

සැලකිය යුතුයි ඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 තෙක් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද ගණන .................................... කි.
1. 4 කි. 2. 6 කි. 3. 5 කි. 4. 7 කි.

(2) එක්වරු ශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථය වනුයේ,
1. දන් දීමයි 2. සමාව දීමයි.
3. බෙදා ගැනීමයි. 4. එක් ආහාර වේලක් ගැනීමයි.

(3) ජේසුස් වහන්සේ විසින් ම ඉගැන් වූ යාච්ඤාව වනුයේ,
1. දයාධික මනස්ථාපනයයි. 2. ස්වාමිවාක් ආරාධනාවයි.
3. නමෝ මරිය යාච්ඤාවයි. 4. විශ්වාස ලක්ෂණයයි.

(4) පැරණි ගිවිසුමේ යච්ඤා පොත වනුයේ,
1. නික්මයාම පොතයි. 2. හිතෝපදේශයයි.
3. ගීතාවලියයි. 4. සලමොන්ගේ ප්‍රඥාවයි.

(5) ජේසුස් වහන්සේගේ මාංශගත වීම සිහිගන්වනුයේ,
1. පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව මගිනි. 2. තුන් කාලයේ ආරාධනාව මගිනි.
3. විශ්වාස ලක්ෂණය මගිනි 4. රැකවල් දේව දූතයාගේ යාච්ඤාව මගිනි.

(6) අපෝස්තුලවරුන්ගේ විශ්වාස ලක්ෂණයෙහි අඩංගු සත්‍යතා ගණන වනුයේ,.....
1. දොළහකි. 2. දහයකි. 3. හතකි. 4. දාහතරකි.

(7) දෙවි පියාණන් ලෙස සලකා කිසිම පුද්ගලයෙකුට හෝ දෙයකට වන්දනා නොකළ යුතු බව උගන්වනුයේ
1. උපදේශකය 3 ඃ 12 - 16 වගන්තියෙනි. 2. කොලොස්සි 3 ඃ 20 වගන්තියෙනි.
3. ද්විතිය නීති සංග්‍රහයේ 5 ඃ 7 - 8 වගන්තියනි. 4. එපිස 6 ඃ 1 - 2 වගන්තියෙනි.

(8) 'දූරා' නම් ස්ථානයේ රන් රූපයක් තබා එයට රට වැසි සියල්ලන් වන්දනා නමස්කාර කළ යුතු බවට රාජ අඥාවක් නිකුත් කළේ,
1. පිලාත් රජු ය. 2. පාරාවෝ රජු ය.
3. හෙරොද් රජු ය. 3. නෙබුකද්නෙශර් රජු ය.

(9) පව් කමා කිරීමේ බලය අපොස්තුළුවරුන්ට පවරා දෙනු ලැබුවේ,

1. පෙන්තකොස්ත දිනදී ය. 2. මහ බ්‍රහස්පතින්දා දිනදී ය.
3. ශුභ සිකුරාදා දිනදී ය. 4. පාස්කු ඉරුදිනදී ය.

(10) සුභාරංචියක් ලියන ලද එකම අන්‍ය අජාතිකයා වනුයේ,

1. ලූක් තුමා ය. 2. මාක් තුමා ය.
3. මාක් තුමා ය. 4. මතෙව් තුමා ය.

- අංක 11 සිට 15 දක්වා නිවැරදි වාක්‍යයට ( ✓ ) ලකුණ ද වැරදි වාක්‍යයට ( ✕ ) ලකුණ ද යොදන්න.

(11) පාරාවෝ රජතුමා ඉශ්‍රායෙල් ජනයාට හිරහැර කළේ ය. ( )

(12) වෙනත් ආගම්වලට ගෞරවයෙන් සැලකීම හොඳ කිතුනු ගුණාංගයක් නොවේ. ( )

(13) සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන තුනකි. ( )

(14) ළමා වියේ ජේසුස් වහන්සේ වැඩුණු ආකාරය ශුද්ධ වූ ලූක් තුමා ගෙනහැර දක්වයි. ( )

(15) දෙවියන් වහන්සේ මිනිසාට ලෝකය භාර දුන්නේ මැවිල්ල වර්ධනය කිරීමට ය. ( )

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා ලියන්න.

(16) දූවිල්ලෙන් සැදූ මිනිසා, ජීවමාන පුද්ගලයකු වන්නේ ................................ නිසා ය.

(17) ඔබට පීඩා කරන්නන් උදෙසා ........................................... කරන්න.

(18) ශුද්ධවර ................................................ අපට යාච්ඤාව සඳහා පහසුවකි.

(19) යාච්ඤාව දෙවියන් වහන්සේ සමඟ ප්‍රේමයෙන් බැඳී කෙරෙන .........................................

(29) එදිරිකාරයාට විරුද්ධව ................................................... නොකරන්න.

**( යාච්ඤා / ජීවන හුස්ම / සුහද සාකච්ඡාවකි / ප්‍රතිමා / එකට එක / සාමය )**

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (i) පංච පුස්තකයට අයත් පොත් 02 ක් නම් කරන්න.

(ii) මරියතුමියගේ මංගල්‍ය 02 ක් නම් කරන්න.

(iii) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන 02 ක් නම් කරන්න.

(iv) පොදු යැදුම් 02 ක් නම් කරන්න.

(v) ජුදා ජාතිකයන්ගේ ආගමික හා ජාතික චාරිත්‍ර 02 ක් නම් කරන්න

(vi) ගොඩ මස් අනුභවයෙන් වැළකී සිටිය යුතු දින 02 ක් නම් කරන්න.

(vii) ''ස්වර්ගයේ වැඩ සිටින'' යාච්ඤාව සඳහා භාවිත වන වෙනත් නම් 02 ක් නම් කරන්න.

(viii) බබිලෝනිය රටේ සැබෑ වූ දෙවියන් වහන්සේට පමණක් මුළු හදවතින් ම වන්දනා කළ ජුදෙව් ජාතිකයන් 02 ක් නම් කරන්න.

(ix) රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා 02 ක් නම් කරන්න.

(x) ප්‍රසාද ස්නාපනයේ දී භාවිත වන සංකේත 02 ක් නම් කරන්න.

($2 \times 10 = 20$)

(02) (i) යාච්ඤාව යනු කුමක් ද? (ල. 2)

(ii) යාච්ඤා වර්ග 03 ක් ලියන්න. (ල. 3)

(iii) ජේසුස් වහන්සේ යච්ඤා කළ අවස්ථා 05 ක් ලියන්න. (ල. 5)

(3) (i) ශු. සභාවේ ශික්ෂා පද 02 ක් නම් කරන්න. (ල. 2)

(ii) එක්වරු ශීලයේ පරමාර්ථ 03 ක් නම් කරන්න. (ල. 3)

(iii) දිව්‍ය පූජාවට ක්‍රියාශීලීව සහභාගී වීමට ඔබට කළහැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 5)

(4) (i) යාච්ඤා කිරීමේදී භාවිතා කරන ක්‍රම 02 නම් කරන්න. (ල. 2)

(ii) පොදු යැදුම් වල ප්‍රයෝජන 03 ක් නම් කරන්න. (ල. 3)

(iii) පොදු යැදුම් උච්චාරණයේ දී පිළිපැදිය යුතු වැදගත් කරුණු 05 ක් ලියන්න. (ල. 5)

(5) (i) දෙවියන් වහන්සේ විසින් පස්වන දිනයේ දී මවන ලද මැවිලි 02 ක් නම් කරන්න. (ල. 2)

(ii) දෙවියන් වහන්සේ විසින් මිනිසාට පැවරූ වගකීම් 03 ක් ලියන්න. (ල. 3)

(iii) දේව මැවිල්ල උදෙසා දෙව් පියාට තුති පුදමින් කුඩා යැදුමක් නිර්මාණය කරන්න. (ල. 5)

(6) (i) අන්තිම රාත්‍රී භෝජනයේ දී ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධාන 02 ක් නම් කරන්න. (ල. 2)

(ii) ආරම්භක දේව ප්‍රසාද නිධාන 3 ක් නම් කරන්න. (ල. 3)

(iii) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වර ප්‍රසාද 05 ක් නම් කරන්න. (ල. 5)

(7) (i) යාච්ඤාව පිළිබඳ ක්‍රිස්තුස් වහන්සේ වදාළ උපමා 02 ක් නම් කරන්න. (ල. 2)

(ii) යාච්ඤාවේ ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 3)

(iii) ස්වාමිවාක් ආරාධනාවේ ප්‍රශංසාත්මක පැතුම් 02 ක් හා ශාරීරික හා අධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම් 03 ක් ලියන්න. (ල. 5)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 6 - 2019

## කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) - 3 | (6) - 1 | (11) - ✓ | (16) - ජීවමාන හුස්ම |
| (2) - 1 | (7) - 3 | (12) - ✕ | (17) - යාච්ඤාව |
| (3) - 2 | (8) - 4 | (13) - ✕ | (18) - ප්‍රතිමා |
| (4) - 3 | (9) - 4 | (14) - ✓ | (19) - සුහද සාකච්ඡාවකි. |
| (5) - 2 | (10) - 1 | (15) - ✓ | (20) - එකට එක |

(2 × 20 = 40)

## II කොටස

(01) (i) * උත්පත්ති පොත
* නික්මයාම
* ලෙවී ව්‍යවස්ථාව
* ගණන් කථාව
* ද්විතීය නීති සංග්‍රහය

(ii) ජනවාරි 01 - පරිශුද්ධ දේව මාතාවන්ගේ මගල්‍යය
අගෝස්තු 15 - මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපන මංගල්‍යය
දෙසැම්බර් 08 - දෙව් මවුන්ගේ නිර්මල පිළිසඳීමේ මංගල්‍යය

(iii) පූජකවරය හා ආශිර්වාදකාර බන්ධනය

(iv) * අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය
* තුන්කාලයේ ආරාධනාව
* පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව
* දයාධික මනස්ථාපනය
* ස්වාමිවාක් ආරාධනාව
* නමෝ මරිය.

(v) * අටවන දින චර්මඡේදනය කිරීම
* නම් තැබීම
* පිරිසිදු වීමේ පිළිවෙත් සිදු කිරීම
* කුළුඳුල් දරුවන් දෙවියන් වහන්සේට කැප කිරීම.

(vi) * අළු බදාදා
* මහ සිකුරුදා සහ අවුරුද්දේ සැම සිකුරාදාම.

(vii) * පරමණ්ඩල යාච්ඤාව
* ස්වාමිවාක් ආරාධනාව

(viii) * ෂදුක්
* මේෂක්

* අබෙද්නෙගෝ

(ix) * කෙනෙකු බලපතල ලෙස ශාරීරිකව රෝගී වී සිටින විට
* බලපතළ ශල්‍යකර්මයකට පෙර
* වයස්ගතව දුර්වල වී සිටින විට
* මරණාසන්න මොහොත
* බරපතළ අනතුරකට පසුව

(x) ජලය / සුදු වස්ත්‍රය / පාස්කු ඉටි පහන / ශුද්ධ වූ තෙලය

(2 × 10 = 20)

(2) (i) දෙවියන් වහන්සේට වන්දනා, ස්තුති, ප්‍රශංසා කරන්නටත් අපට අවශ්‍ය දේ ඉල්ලා ගන්නටත් ඔවුන් වහන්සේ වෙත සිත යොමු කිරීමකි. (පිටු අංක 92)

(ii) * ප්‍රශංසාව
* තුති පිදීම
* කමාව අයැදීම
* වරප්‍රසාද ඉල්ලා ගැනීම (පිටු අංක 92)

(iii) * බෞතීස්මය ලැබීමේදී
* සුවය දානය කිරීමට පෙර
* කුරුස ගසේ දී
* අපොස්තුලුවරුන් තොරා ගැනීමට පෙර
* අන්‍ය රූප විලශ වීමට පෙර (පිටු අංක 97)

(3) (i) * ඉරු දිනත් ණය මංගල්‍ය දිනත් මුලු පූජා යාගයට සහභාගී වීම.
* වසරකට වරක්වත් පාපොච්චාරණය කිරීම
* පාස්කු සමය තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම
* නියම වූ දිනයන්හි ගොඩමස් වැළකීම සහ එක්වරු ශීලය රැකීම.
* සභාවේ නඩත්තුවට ආධාර දීම .... (පිටු අංක 87)

(ii) * තමන්ගේ පාපවලට වන්දි ගෙවීම
* ආත්ම දනමය පුහුණු කිරීම
* නිරාහාරව දින හතළිහක් උපවාස කළ ක්‍රිතුන් වහන්සේ අනුගමනය කිරීම

(iii) * දිව්‍ය පූජාව ආරම්භයේ සිට අවසානය තෙක් දිව්‍ය පූජාවට සහභාගී වීම.
* භක්තියෙන් දිව්‍යසත්ප්‍රසාද වන්සේ ලබා ගැනීම
* අනවශ්‍ය කතා බහේ නොයෙදීම
* ගීතිකාවලට සම්බන්ධ වීම
* දේව වාක්‍යයට සවන් දීම .... (ආදී සිසුවා විසින් ලියා ඇති කරුණු වලට ලකුණු ලබා දෙන්න)

(4) (i) * කට පාඩම් කරගත් යාච්ඤා භාවිත කිරීම
* තමන් විසින් ම නිර්මාණය කළ යාච්ඤා භාවිත කිරීම

(ii) * යාච්ඤා කිරීමට හුරුවක් ලැබීම
* පොදුවේ යාච්ඤා කරන විට ශබ්ද නගා සියලු දෙනාටම උච්චාරණය කළ හැකි වීම
* යාච්ඤා නිර්මාණයට මඟ පෙන්වීමක් ලැබීම
* පෞද්ගලික යාච්ඤාවේ දී පවා භාවිත කළ හැකි වීම.

(iii) * සමූහයක් වශයෙන් එක්ව උච්චාරණය කිරීම
* ශබ්ද නගා උච්චාරණය කිරීම
* ඉතා පැහැදිලිව උච්චාරණය කිරීම
* නිවැරදි ඉරියව් භාවිත කිරීම
* අවධානයෙන් යුතුව කීම .....ආදී පිළිතුරු (පිටු අංක 111)

(5) (i) පක්ෂීන් හා මසුන්

(ii) * දරු සම්පත් ලැබීමට

* පොළොව පුරා පැතිර යාමට
* මැවිල්ල පාලනය කිරීම හා රැකබලා ගැනීම
* පොළොව වගා කිරීමට
* වගාවෙන් ලැබෙන අස්වැන්න ප්‍රයෝජනයට ගැනීමට

(iii) සිසුවා ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

(6) (i) * දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
* පූජකවරයායි.

(ii) * ප්‍රසාද ස්නාපනය
* දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
* අභිවෘද්ධි ආලේපය

(iii) * දේව දරුකම
* සුරලොවේ හිමිකරුවෙකු වීම
* ශුද්ධ වූ සභාවේ සාමාජිකත්වය
* ජන්ම හා කර්ම පාප කමා කරනු ලැබීම
* අනෙකුත් දේව ප්‍රසාද නිධාන ලැබීමට සුදුස්සකු වීම. (පිටු අංක 43)

(7) (i) * පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව
* මැදියම් රැයේ පැමිණි මිත්‍රයා පිළිබඳ උපමාව
* අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා පිළිබඳ උපමාව (පිටු අංක 93)

(ii) * දේව ප්‍රශංසාව
* දේව නමස්කාරය
* ඉල්ලීම
* සමාව යැදීම
* දේව ආරක්ෂාවට නතු වීම

(iii) **ප්‍රශංසාත්මක පැතුම**
* ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා.
* ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා
* ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවෙහිද ඉටු වේවා.

**ශාරීරික හා අධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම**
* අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව
* අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදිද කමා කළ මැනව
* පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදී
* අයහපතින් අප මුදා ගත මැනව (පිටු අංක 105)

(ප්‍රශංසාත්මක පැතුම් 2 ක් හා ශාරීරික හා අධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම 3 ක් ලියා ඇත්නම ලකුණු ලබා දෙන්න.)